**ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල - 2018**

**-----------------------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

----------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

---------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබාගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම්කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලිද ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතුකර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතාකර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන
------------------

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම
-------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 හි 47 ඡේදය ප්‍රකාරව, ප්‍රමාණාත්මක පූර්ව කාලපරිච්ඡේද වැරදි ඒවා සොයා ගැනීමෙන් පසුව නිකුත් කිරීම සඳහා අනුමත කරන පළමු මූල්‍ය ප්‍රකාශන කට්ටලයෙහි, වරද සිදු වූ කාලපරිච්ඡේදය සඳහා ඉදිරිපත්කර ඇති සංසන්දනාත්මක අගයන් නැවත ප්‍රකාශ කිරීමෙන් අතීතානුයෝගීව නිවැරදි කළ යුතු වුවද, එසේ නොකර පෙර වර්ෂ ගැලපීම් ලෙස රු.3,448,745 ක් සමාලෝචිත වර්ෂයේ වියදම් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | අදහස් ඉදිරිපත්කර නොතිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. මෙම වැරදි නිවැරදි කර 2019 වර්ෂයේ ගිණුම් පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 5 හි 31 ඡේදය ප්‍රකාරව, විදේශ මුදල් රුපියල්වලට පරිවර්තනය කිරීමේදී ඇතිවන ලාභය හෝ පාඩුව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වුවද, ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකුව විසින් හඳුනාගෙන තිබුණු රු.177,519 ක විදේශ මුදල් පරිවර්තනය කිරීමේ පාඩුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණි. | අදහස් ඉදිරිපත්කර නොතිබුණි. | -එම - |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 69 ඡේදය ප්‍රකාරව, වත්කමක ක්ෂය කිරීම ආරම්භ වන්නේ එය පාවිච්චි කිරීමට සුදානම් තත්ත්වයට ගෙන ආ පසුව වුවද සහ වත්කම හඳුනාගැනීමෙන් ඉවත් කළ පසු ක්ෂය කිරීම නවතා දැමිය යුතු වුවද, ඊට පටහැනිව වත්කම් ක්ෂය කිරීමේදී වත්කම මිලදීගත් දිනය සහ ඉවත් කිරීමේ දිනය නොසලකා මිලදීගත් වර්ෂයට ක්ෂය නොකිරීමේ හා ඉවත්කළ වර්ෂය වෙනුවෙන් ක්ෂය කිරීමේ ප්‍රතිපත්තිය අනුගමනය කර තිබුණි. | අදහස් ඉදිරිපත්කර නොතිබුණි. | -එම - |

## 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අරමුදලේ ආදායම් හා වියදම් උපචිත පදනම මත ගිණුම්ගත කරන බව හෙළිදරව්කර තිබුණි. එසේ වුවද ජාතික අක්ෂි බැංකුවට අදාළ ආදායම් හා වියදම් අරමුදලට ඒකාබද්ධ කිරීමේදී මුදල් පදනම මත මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්කර තිබුණි. | අදහස් ඉදිරිපත්කර නොතිබුණි. | අරමුදලේ ආදායම් හා වියදම් මෙන්ම ජාතික අක්ෂි බැංකුවේ ගනුදෙනුද උපචිත පදනම මත ගිණුම්ගත කළ යුතුය. අනුගමනය කරන ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |
| (ආ) | අරමුදලේ ව්‍යාපෘතියක් වූ ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකුව සතුව 2018 දෙසැම්බර් 31 දිනට පැවති ශුද්ධ අගය රු.9,339,612 ක් වූ දේපල, පිරියත හා උපකරණද, පිරිවැය රු.2,890,100 ක් වූ වෛද්‍ය හා ශල්‍ය සැපයීම් තොගද, රු.1,059,391 ක් වූ ලැබිය යුතු ගිණුම්ද, රු.2,837,647 ක් වූ ගෙවිය යුතු ගිණුම්ද, අත්තිකාරම් ලැබීම් රු.1,876,949 ක් සහ කලින් ගෙවීම් රු.365,673ක් ද අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණි. | අදහස් ඉදිරිපත්කර නොතිබුණි. | ජාතික අක්ෂි බැංකුව සතු වත්කම් හා වගකීම් පිළිබඳ සියළු තොරතුරු අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකුව ආරම්භ කිරීම සඳහා 2012 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වූ වර්ෂ 4 කදී ආසියා කුණික පදනමෙන් ලැබී තිබුණු රු.12,873,923 ක මූල්‍ය ප්‍රදාන හා රු.7,687,236 ක මූල්‍යමය නොවන ආධාර ගිණුම්ගත කර නොතිබුණි. | අදහස් ඉදිරිපත්කර නොතිබුණි. | -එම - |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ආසියා කුණික පදනමේ ප්‍රදාන යටතේ ඉදිකර තිබුණු මහනුවර ශික්ෂණ රෝහලේ ජාතික අක්ෂි බැංකු ගොඩනැගිල්ලේ පිරිවැය හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතුකර නොතිබුණි. | අදහස් ඉදිරිපත්කර නොතිබුණි. | -එම - |

**1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විෂයය | | අරමුදලේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | ජාතික අක්ෂි බැංකුවේ මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | | |
| (අ) | ජාතික අක්ෂි බැංකුවේ කුණික සැකසුම් ගාස්තු | 43.82 | 41.94 | 1.88 | අදහස් ඉදිරිපත්කර නොතිබුණි. | අරමුදලේ මූල්‍ය ප්‍රකාශන හා ජාතික අක්ෂි බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂයන් සසඳා වෙනසට හේතු සොයා ගැලපීම් කළ යුතුය. |
| (ආ) | ජාතික අක්ෂි බැංකුවේ වියදම් | 53.52 | 60.75 | 7.23 | අදහස් ඉදිරිපත්කර නොතිබුණි. | |
| (ඇ) | ජාතික අක්ෂි බැංකුවේ සුළුතර පොලී | 15.07 | 29.23 | 14.16 | අදහස් ඉදිරිපත්කර නොතිබුණි. | |

### 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විෂයය | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| අධ්‍යයන හා පර්යේෂණ කටයුතු සඳහා ජාතික අක්ෂි බැංකුව විසින් බාහිර පාර්ශවයන් වෙත අක්ෂි පටල 58 ක් ලබාදීම. | අක්ෂි පටල ඉල්ලීම් හා නිකුත් කිරීම් පිළිබඳ තොරතුරු හා අදාළ පාර්ශව විසින් අක්ෂි පටල භාරගත් බවට ලිඛිත සාක්ෂි. | අදහස් ඉදිරිපත්කර නොතිබුණි. | බාහිර පාර්ශවයන් විසින් සිදුකරනු ලබන අක්ෂි පටල ඉල්ලීම් හා නිකුත් කිරීම් පිළිබඳ තොරතුරු හා අක්ෂි පටල භාරගත් බව තහවුරු කිරීමේ ලිපි ලේඛන පවත්වා ගත යුතුය. |

### 1.6 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1981 අංක 13 දරන ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල් පනතේ 8 වන වගන්තිය. | අරමුදලට අයත් මුදලක් ආයෝජනය කරන්නේ නම් අමාත්‍යවරයා විසින් දෙනු ලබන විධානවලට යටත්ව ආයෝජනය කළ යුතු වුවද, ඉන් බැහැරව 2018 දෙසැම්බර් 31 දින වන විට රු.692,000,000 ක් ස්ථාවර තැන්පතුවලද රු.403,053,755 ක් භාණ්ඩාගාර බිල්පත්වලද ආයෝජනය කර තිබුණි. | අදහස් ඉදිරිපත්කර නොතිබුණි. | පනතේ විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය. | | | |
| (i) මුදල් රෙගුලාසි 71 | භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්වරයාගේ පූර්ව අධිකාරි බලය හා රාජ්‍ය පරිපාලන විෂයභාර අමාත්‍යාංශ ලේකම්වරයාගේ එකඟතාව ලබාගැනීමෙන් තොරව, ජාතික අක්ෂි බැංකුවේ නිලධාරීන් 23 දෙනෙකුගේ තනතුරු පදවි නාම | අදහස් ඉදිරිපත්කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | වෙනස්කර නව තනතුරු 03 ක් ඇතිකර එම නව තනතුරුවලට ඔවුන්ව අනුයුක්ත කර තිබුණි. | | |
| (ii) | මුදල් රෙගුලාසි 381 | භාණ්ඩාගාර අනුමැතිය ලබාගැනීමෙන් තොරව 2016 වර්ෂයේදී රාජ්‍ය බැංකුවක ඉතිරි කිරීමේ ගිණුමක් ආරම්භකර තිබුණු අතර 2018 දෙසැම්බර් 31 දිනට එම ගිණුමේ ශේෂය රු.8,073,404 ක් විය. | අදහස් ඉදිරිපත්කර නොතිබුණි | -එම- |

**2. මූල්‍ය සමාලෝචනය**

-----------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

---------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.207,163,462 ක ලාභයක්වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු.137,277,233 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.69,886,229 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට, සමාලෝචිත වර්ෂයේ වියදම රු.183,590,255 කින් අඩු වී තිබුණද, ආදායම රු.113,704,026 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

--------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකුව පිහිටුවීමට සිංගප්පූරුවේ Asia Cornea Foundation ආයතනය සමඟ 2010 වර්ෂයේදී එළඹ තිබුණු අවබෝධතා ගිවිසුමට අනුව හා ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකුව භාරයක් ලෙස ස්ථාපනය කිරීම සඳහා 2013 අගෝස්තු 29 දින ලැබී තිබුණු අමාත්‍ය මණ්ඩල අනුමැතිය ප්‍රකාරව, ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකුව පනතක් මගින් වෙනම ආයතනික ව්‍යුහයක් සහිත ඒකකයක් වශයෙන් ස්ථාපිත කිරීමට හා එහි ගනුදෙනු වාර්තා කිරීම සඳහා වෙනම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට 2019 මැයි 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | අදහස් ඉදිරිපත්කර නොතිබුණි. | අවබෝධතා ගිවිසුමට අනුව හා ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකුව භාරයක් ලෙස ස්ථාපනය කිරීම සඳහා ලැබී තිබුණු අමාත්‍ය මණ්ඩල අනුමැතිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකුව භාරයක් ලෙස ස්ථාපිත කරන තෙක් එහි කටයුතු ව්‍යාපෘතියක් වශයෙන් අඛණ්ඩව පවත්වාගෙන යාමටද, 2007 අප්‍රේල් 05 දිනැති අංක 33 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුව කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට හා වැටුප් ගෙවීමටද අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. එසේ වුවද අංක 33 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 1.1 ඡේදය ප්‍රකාරව ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකුව ව්‍යාපෘතියක් ලෙස සැලකීමට අවශ්‍ය කොන්දේසි සම්පූර්ණ වී නොතිබීම හේතුවෙන් අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි කටයුතුකළ නොහැකිව තිබුණි. | අදහස් ඉදිරිපත්කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව, ජාතික අක්ෂි බැංකුව ව්‍යාපෘතියක් ලෙස සැලකිය නොහැකි බව හා ඒ අනුව කාර්ය මණ්ඩලය බඳවාගත නොහැකි බව අමාත්‍ය මණ්ඩලය දැනුවත් කළ යුතුය. විකල්ප ක්‍රියාමාර්ග පිළිබඳ සොයා බලා ඒ අනුව කටයුතු කළ යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | -------------- | ------------ |
| (අ) | ජාතික අක්ෂි බැංකුව සංවර්ධනය කිරීම හා පුහුණුවලත් අක්ෂි කාර්ය මණ්ඩලයක් ඇති කිරීම අරමුණු කරගෙන, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය හා ඇමරිකා එක්සත් ජනපදයේ Sight Life (SL), Seattle WA ආයතනය සමඟ වර්ෂ 5ක් සඳහා වූ ගිවිසුමකට එළඹ තිබුණි. ඒ අනුව 2016 වර්ෂය පාදක කරගෙන දිවයිනේ ප්‍රධාන රෝහල්වල අක්ෂි බැංකු ශාඛා පිහිටුවීම හා අක්ෂි පටල අවශ්‍යතා සැපයීම ඉලක්ක කරගනිමින් සැලසුම් පිළියෙලකර නොතිබීමත්, මෙ සම්බන්ධයෙන් ප්‍රමාණවත් කාර්යසාධනයක් නොපෙන්වීමත් හේතුවෙන් ඇමරිකා එක්සත් ජනපද ඩොලර් 14,000 ක් ලබාගැනීමට නොහැකි වී තිබුණි. | අදහස් ඉදිරිපත්කර නොතිබුණි. | ජාතික අක්ෂි බැංකුවේ සංවර්ධනය වෙනුවෙන් ලැබෙන විදේශ ආධාර සම්බන්ධයෙන් එළඹි ගිවිසුම් අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2016 වර්ෂයේදී ව්‍යාපෘති කාලය අවසන් වී තිබුණු ඩෙංගු ආවේක්ෂණ ව්‍යාපෘතියෙහි ඉතිරි වී තිබුණු රු.13,433,573 ක් පරිත්‍යාග කළ ආයතනය වෙත යැවීමට හෝ ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදලෙහි පොදු අරමුදල වෙත පවරා ගැනීමට හෝ පියවර ගෙන නොතිබුණි. | අදහස් ඉදිරිපත්කර නොතිබුණි. | විදේශාධාර ව්‍යාපෘති නිම වූ පසු ඉතිරි මුදල් සම්බන්ධයෙන් අවබෝධතා ගිවිසුම ප්‍රකාරව කටයුතු කළ යුතුය. නොඑසේ නම් එම මුදල් ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදලේ පොදු අරමුදල වෙත පවරා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | කොන්ත්‍රාත් 14 ක ඉදිකිරීම් නිම වී තිබුණද, වර්ෂ 2 සිට වර්ෂ 5 දක්වා කාල පරාසයක සිට පැවතෙන රු.1,128,619 ක් වූ රැඳවුම් මුදල් නිරවුල් කිරීමට හෝ ආදායමක් ලෙස හඳුනාගැනීමට හෝ කටයුතුකර නොතිබුණි. | අදහස් ඉදිරිපත්කර නොතිබුණි. | රැඳවුම් මුදල් නිරවුල් කිරීමට හෝ ආදායමක් ලෙස හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | ලෝක සෞඛ්‍ය සංවිධානය සහ සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ සහයෝගීතාවයෙන් කොරියන් වෛද්‍යවරුන් 8 දෙනෙකු වෙත Cardiac Angiography සහ Gastric and Liver Cancer ක්ෂේත්‍රයන්ට අදාළව පුහුණුවීම් කොළඹ ජාතික රෝහල, මහනුවර ශික්ෂණ රෝහල හා මහරගම අපේක්ෂා රෝහල යන රෝහල් තුළදී 2017 දෙසැම්බර් 18 සිට 2018 පෙබරවාරි 09 දක්වා කාලය තුළ ලබා දී තිබුණි. මේ පිළිබඳව පහත සඳහන් කරුණු අනාවරණය විය. | | |
| | (i) 2017 වර්ෂයේදී පුහුණුවීම් සඳහා ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදලට ලැබී තිබුණු රු.1,400,000 ක් රජයේ ආදායමට බැරකර නොතිබුණි. | අදහස් ඉදිරිපත්කර නොතිබුණි. | සියළු විදේශ මුදල් රජයේ ආදායමට බැර කළ යුතුය. |
| | (ii) Cardiac Angiography ක්ෂේත්‍රයට අදාළව පුහුණුවීම් සඳහා සම්පත් දායකයන් 6 දෙනෙකු වෙත රු.60,000ක් ගෙවීමට ආයතන අධ්‍යක්ෂගේ අනුමැතිය ලැබී තිබුණද, සම්පත් දායකයින් 12 දෙනෙකු වෙත රු.132,500 ක් ගෙවා තිබුණි. | -එම- | ආයතන අධ්‍යක්ෂගේ උපදෙස්වලට පටහැනිව ගෙවීම් නොකළ යුතුය. |
| | (iii) ලෝක සෞඛ්‍ය සංවිධානය සමඟ එළඹ තිබුණු ගිවිසුම ප්‍රකාරව, පුහුණු පාඨමාලාව නිම වූ පසු ඉතිරි රු.1,890,857 ක් එම සංවිධානය වෙත ආපසු යවා නොතිබුණි. | -එම- | අවබෝධතා ගිවිසුම ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඉ) | විදේශීය වෛද්‍ය හා පරිපූරක වෛද්‍ය සිසුන් හට අනුරාධපුර හා මහනුවර ශික්ෂණ රෝහල් තුළ පුහුණුව ලබාදීම සඳහා "Work the World" ආයතනය සමඟ ගිවිසුමකට එළඹී තිබුණු අතර ඒ පිළිබඳව පහත සඳහන් කරුණු අනාවරණය විය. | | |
| | (i) අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබානොගෙන සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ උපදෙස් පරිදි "Work the World" ආයතනය සමඟ අනුරාධපුර ශික්ෂණ රෝහල එළඹී ගිවිසුමෙහි පාර්ශව දෙක වෙනුවෙන් අත්සන් කරන ලද නිලධාරීන්ගේ නම, තනතුරු, නිල මුද්‍රා කිසිවක් සඳහන්කර නොතිබුණු හෙයින් ගිවිසුමෙහි ඇතුළත් එකඟතා සඳහා වගකිවයුත්තන් හඳුනාගත නොහැකි විය. | අදහස් ඉදිරිපත්කර නොතිබුණි. | විධිමත් ලෙස ගිවිසුම්වලට එළඹිය යුතුය. මෙවැනි විදේශ ව්‍යාපෘති පිළිබඳව අමාත්‍යාංශ ලේකම්වරයා දැනුවත් කර අනුමැතිය ලබා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | පුහුණු පාඨමාලා ගාස්තු ලෙස අනුරාධපුර ශික්ෂණ රෝහල වෙත ලැබී තිබුණු මහා බ්‍රිතාන්‍ය පවුම් (GBP) 30,900 කට සමාන රු.6,198,126 ක් රජයේ ආදායමට බැර නොකර 1981 අංක 13 දරන ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල් පනතේ 7 වගන්තියේ දැක්වෙන විධි විධානවලට පටහැනිව අරමුදලට බැරකර තිබුණි. | -එම- | පනතේ විධි විධානවලට පටහැනිව කටයුතු නොකළ යුතු අතර සියළු විදේශ මුදල් රජයේ ආදායමට බැර කළ යුතුය. |
| (iii) | මහනුවර ශික්ෂණ රෝහල තුළ පුහුණු කරන සිසුන්ගේ පුහුණු පාඨමාලා ගාස්තු ලෙස මහනුවර පශ්චාත් උපාධි වෛද්‍ය මධ්‍යස්ථානය වෙත 2017 හා 2018 වර්ෂවලදී ලැබී තිබුණු රු.27,551,528 ක් රජයේ ආදායමට හෝ අරමුදලට බැර නොකර මහනුවර පශ්චාත් උපාධි වෛද්‍ය මධ්‍යස්ථාන ගිණුමට බැරකර තිබුණි. කිසිදු අධිකාරී බලයකින් තොරව ඉන් රු.20,022,335 ක් එම මධ්‍යස්ථානය විසින් වැයකර තිබුණි. | -එම- | කිසිදු අධිකාරී බලයකින් තොරව වියදම් කිරීම සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදුකළ යුතුය. |

**3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකුව ව්‍යාපෘතියක් ලෙස සැලකිය හැකි අවශ්‍යතාවයන් සපුරා නොතිබියදී, 2007 අප්‍රේල් 05 දිනැති අංක 33 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය උපයෝගී කරගනිමින් ව්‍යාපෘති දීමනා හා ගෞරව දීමනා වශයෙන් නිලධාරීන් 29 දෙනෙකු වෙත රු.3,355,168 ක් සමාලෝචිත වර්ෂය තුළදී ගෙවා තිබුණි. | අදහස් ඉදිරිපත්කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවන දීමනා ගෙවීමෙන් වැළකිය යුතුය. ගෙවා තිබුණු දීමනා සඳහා ආයතන අධ්‍යක්ෂගේ අනුමැතිය ලබා ගැනීමට හෝ ආපසු අයකර ගැනීමට හෝ කටයුතු කළ යුතුය. |
| (ආ) | 2018 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා වූ මාස 09 තුළදී ජාතික රුධිර පාරවිලයන සේවය විසින් රුධිර ප්ලාස්මා විකිණීම සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු අනාවරණය විය. | | |
| (i) | රුධිර ප්ලාස්මා විකිණීමෙන් උපයා තිබුණු රු.91,298,655 ක් රාජ්‍ය ආදායමට බැර නොකර, විධිමත් අධිකාරී බලයකින් තොරව අරමුදල යටතේ පවතින මධ්‍යම ලේ බැංකු සංවර්ධන අරමුදල් ගිණුමට බැරකර තිබුණි. | අදහස් ඉදිරිපත්කර නොතිබුණි. | රුධිර ප්ලාස්මා විකුණුම් ආදායම රජයේ ආදායමට බැර කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | (ii) රුධිර ප්ලාස්මා ගැණුම්කාර සමාගම වෙතින් ලබාගෙන තිබුණු චෙක්පත් ජාතික රුධිර පාරවිලයන සේවය නමින් ලබා නොගෙන, අරමුදල නමින් ලබාගෙන තිබුණි. ඒ හේතුවෙන් චෙක්පත් සඳහා අරමුදල විසින් නිකුත්කර තිබුණු කුවිතාන්සි, රුධිර ප්ලාස්මා විකිණීමෙන් ලද මුදල් වෙනුවෙන් නිකුත්කළ යුතු වුවද, ඒ වෙනුවට රුධිර පාරවිලයන සේවයේ අවශ්‍යතා වෙනුවෙන් අරමුදල වෙත අදාළ සමාගම විසින් කරන ලද පරිත්‍යාග මුදලක් වශයෙන් කුවිතාන්සි නිකුත්කර තිබුණි. | -එම- | |
| | (iii) ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල් පනතේ 13 (4) වගන්තිය ප්‍රකාරව, අරමුදල වෙත කරනු ලබන පරිත්‍යාග 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ කාර්ය සඳහා එම පරිත්‍යාගයේ මුළු වටිනාකම වෙනුවෙන් බදු නිදහස් සහනය ලැබීමට ත්‍යාගදායකයා හිමිකම් ලබන හෙයින් මෙම ගනුදෙනු හේතුවෙන් රජයට හිමි විය යුතු බදු ආදායමද අහිමි වී තිබුණි. | -එම- | |
| (ඇ) | අරමුදලේ අරමුණු හා කාර්යයන්ට ගැලපෙන පරිදි බාහිර පාර්ශවයන්ට මූල්‍යාධාර ලබාදීමේ පදනමක් හා නිශ්චිත ප්‍රතිපත්තියක් හඳුනාගෙන නොතිබුණි. අරමුදල් පනතේ 7 වගන්තියෙහි දක්වා ඇති කාර්යයන්හි විෂය පථය තුළට ඇතුළත් නොවන ක්‍රියාකාරකම් සඳහා සමාලෝචිත වර්ෂය තුළදී පමණක් විවිධ සංගම් හා ආයතන 14 ක් වෙත ලබා දී තිබුණු මූල්‍යාධාර රු.21,044,400 ක්විය. | අදහස් ඉදිරිපත්කර නොතිබුණි. | අරමුදල් පනතෙහි දක්වා ඇති කාර්යයන්හි විෂය පථය තුළට ඇතුළත් නොවන ක්‍රියාකාරකම් සඳහා මූල්‍යාධාර ලබා නොදිය යුතුය. |
| (ඈ) | පුද්ගලික පදනමින් රෝගීන් වෙත ආධාර ලබාදීමට අරමුදල් පනතේ ප්‍රතිපාදන සලසා නොතිබුණු නමුත්, සමාලෝචිත වර්ෂය තුළදී රෝගීන් 12 දෙනෙකු වෙත රු.11,029,810 ක මූල්‍යාධාර ලබාදී තිබුණි. | අදහස් ඉදිරිපත්කර නොතිබුණි. | -එම- |

## 3.4 අරමුදල් ඌන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නිශ්චිත කාර්යයන් 21 ක් සඳහා ලැබී තිබුණු රු.28,527,514 ක පරිත්‍යාග වර්ෂ 2 ක සිට වර්ෂ 30 ක් අතර කාලපරාසයක් තුළ එම අරමුණුගත කාර්යයන් ඉටුකිරීම සඳහා උපයෝජනයකර නොතිබුණි. | අදහස් ඉදිරිපත්කර නොතිබුණි. | නිශ්චිත කාර්යයක් ඉටු කිරීම සඳහා ලැබී ඇති අරමුදල් එම කාර්ය ඉටුකිරීම සඳහා යෙදවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා වූ එක් එක් වර්ෂවලදී ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල සතු පොදු අරමුදලෙන් උපයෝජනය කළ හැකිව තිබුණු අරමුදල් පිළිවෙලින් රු.261,124,443ක්, රු.295,194,406 ක්, රු.358,057,285 ක්, රු.387,348,323 ක් හා රු.425,345,893 ක් විය. එසේ වුවද පිළිවෙලින් සියයට 79 ක්, සියයට 82 ක්, සියයට 77 ක්, සියයට 72 ක් හා සියයට 77 ක් අරමුදලේ අරමුණු වෙනුවෙන් උපයෝජනය නොකර ඉතිරිකර තිබුණි. | අදහස් ඉදිරිපත්කර නොතිබුණි. | ශ්‍රී ලංකාවේ සෞඛ්‍යාරක්ෂක කටයුතු වෙනුවෙන් මුදල් වැය කිරීම අරමුදලේ ප්‍රධාන අරමුණ වන බැවින්, එම අරමුණ ඉටුකිරීම සඳහා කටයුතු කළ යුතුය. |

## 3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මීගහකිවුල රෝහලේ වාට්ටු සංකීර්ණය ඉදිකිරීම් කටයුතු නියමිත දිනට හා නිසි ලෙස ඉටුකර නොතිබීම හේතුවෙන් කොන්ත්‍රාත්තුව අවසන්කර වර්ෂ 8 කට වඩා වැඩි කාලයක් ගතව තිබුණද, රු.1,372,346 ක කාර්යසාධන සුරක්ෂණය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදහස් ඉදිරිපත්කර නොතිබුණි. | මේ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් සිදුකර වගකිව යුතු නිලධාරීන්ගෙන් මුදල අයකර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | Asia Cornea Foundation හි පරිත්‍යාගයක් වූ කුරුණෑගල ශික්ෂණ රෝහල තුළ අක්ෂි බැංකුවක් පිහිටුවීම සඳහා උපදේශක සේවා ලබාගැනීම වෙනුවෙන් ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය වෙත 2017 වර්ෂයේදී රු.721,962 ක් ගෙවා තිබුණි. 2018 වර්ෂයේදී පළමු අදියරේ ඉදිකිරීම් රු.14,162,162 ක කොන්ත්‍රාත් වටිනාකමකට පිරිනමා තිබුණු නමුත්, කුරුණෑගල රෝහලේ වෛද්‍යවරුන්ගේ විරෝධතාව මත ඉඩම ලබාගත නොහැකිවීම හේතුවෙන් ඉදිකිරීම් ආරම්භ කළ නොහැකි වී තිබුණි. උපදේශක සේවා ලබාගැනීමට පෙර ඉඩම නිරවුල් කරගැනීමේ කටයුතු සිදුනොකිරීම හේතුවෙන් රු.721,962 ක උපදේශක සේවා ගාස්තුව නිෂ්කාර්ය වියදමක් වී තිබුණි. | අදහස් ඉදිරිපත්කර නොතිබුණි. | මෙවැනි නිෂ්කාර්ය වියදම් ඇති නොවන ලෙස සැලසුමකට අනුව වගකීමෙන් කටයුතු කළ යුතුය. |
| (ඇ) | හැකි සෑම අවස්ථාවකදීම විවෘත තරඟයට යොමු කිරීම මගින් ප්‍රසම්පාදන අවශ්‍යතාවයන් සපුරාගත යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළදී තරඟකාරී ලංසු කැඳවීමෙන් තොරව තෝරාගත් පෞද්ගලික රෝහලකින් රසායනාගාර පරීක්ෂණයන් සිදුකර ගැනීම සඳහා රු.4,308,602 ක් වැය කර තිබුණි. | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |